KP ගේ කොලම

තරු විසිවුන සිංහල සිනමාව

එක්තරා කාලයක සිංහල සිනමාව ගැන අපට තියෙන්නේ හරිම ආදරණීය මතකයකි. 70-80 දශකයේ සිංහල චිත්‍රපට අප ජීවිතයේ රස සාගරයක් කරන්නට අධ්‍යක්ෂකවරුන්ට, නිෂ්පාදකවරුන්ට, නළු නිළියන්ට හැකිවන්නේ ඔවුන් ඒ සඳහා කරන ආදරණීය හා අවංක කැපවීම නිසාමය.

ගාමිණී - මාලනී, විජය - මාලනී, රුක්මණී, ජෝ, ගීතා, ස්වර්ණා, අනෝජා, රවීන්ද්‍ර, ටෝනි, තිස්ස, රෝයි - සුමනා, ජීවරානි, සන්ධ්‍යා, පුනහා, අනුලා, ශ්‍රියානි, වීනා, සනත්, ජීවන්, නදීකා, සබීතා වැන්නවුන් වීරයන්, පෙම්වතුන්, පෙම්වතියන් වෙද්දී ඩොමී, පියදාස ගුණසේකර, රෙක්ස්,මර්වින්, බන්දු මුණසිංහ අපූරු දුෂ්ඨයන් විය. එඩී, ෆ්‍රෙඩී, ඩී. ආර්, බී.එස්, දොන් සිරිසේන, ලිලියන් පර්ල්, බන්දු, රිදී තිරයේදී අපව අපූරු විනෝදාස්වාදයන්ගෙන් පිරි ලෝකවලට අපව කැඳවාගෙන ගියෝය.

කලං, අයිරාංගනී, කොස්තා, පියදාස විජේකෝන්, දෙනවක හාමිනේ අප තුළ තබන්නේ මිහිරි මතකයන්ය. මේ සිනමාවේ රංගන පරාසය විචිත්‍රවත් කළ අපූරු නිර්මාණකරුවන්ගේ නාමාවලියේ කොටසක්ය.

මේ පරම්පරාවෙන් පසු දිල්හානි, සංගීතා, ටෙනී, රන්ජන් සිනමාවේ ආකර්ෂණයට එකතුවන්නේ මේ මෑත භාගයේදිය. මේ නාමාවලිය 70- 80 දශකයේ නාමාවලියට වඩා ගොඩක් අඩුය.සිනමාමේ කඩා වැටීම ඇරඹෙන්නේ මේ සිනමා තරුවල අඟ හිඟයත් සමඟිනි. අද වන විට සිනමාවේ තරු ලෙස හැඳින්වීමට නම් දෙකකට වඩා සොයා ගැනීමට නොහැකිවී ඇත.අධ්‍යක්ෂවරයෙකුට චිත්‍රපටයක් නිර්මානය කිරීමට නළු නිළියන් ප්‍රබල ලෙස අවශ්‍ය බව කීමද විහිළුවකි.

නමුත් ඇත්තටම අද ඒ විහිළුව කීමට සිදුවී ඇත්තේ සිනමාවේ තරු පායන්නේ නැති නිසාය.කාලයක් තිස්සේ වැළලී ගිය සිනමා තරු අද පායන්නේ නැත. අද ඇත්තේ අවශ්‍යතාවයට කොහෙන් හෝ හොයාගන්නා නළු-නිළි පිරිසකි. චිත්‍රපට මංගල දර්ශනයකට නළු නිළියන් එනතුරු සිනමා ශාලා පෝලිමේ වැටේ එල්ලී සිටි යුගය අද නැත. බලන්නට සිනමාවක්ද නැති තරම්ය. ලෝකයේ බොහෝ රටවල් සිනමාව ප්‍රබල කර්මාන්තයක් කරගන්නා අතරතුර අප පෞද්ගලික අවශ්‍යතාවන් උදෙසා කරනු ලබන ආතල් කර්මාන්තයක් ලෙස සිනමාව පත්කර තිබීම ඉතාම කණගාටුවකි.

ලෝකයේ ජනප්‍රිය රංගන ශිල්පී ශාරුක් ඛාන් ඔහුගේ අලුත්ම චිත්‍රපටයට පූර්ව ප්‍රචාරයක් ලබා දීමට නළුවෙකු වශයෙන් කළ හැකි උපරිමය කරද්දී අප රටේ බොහොම අමාරුවෙන් හැදෙන චිත්‍රපටයේ පූර්ව ප්‍රචාරක කටයුතු කරගන්නට අධ්‍යක්ෂවරියකට නළු නිළියන් දෙපළ පසු පස්සේ හඩා වැටීමට සිදු වී ඇත.

අපේ රටේ දැන් සිටින්නේ එදිනෙදා ආතල් එකට රඟපාන නළු නිළියන් හා පුහු මාන්නයක් හා මෝඩකමකින් ඔලුව උදුම්මවා ගත් ඉට්පන්දම් එළි කීපයක් පමණි.

රඟපෑමට මුවාවෙන් විකිණෙන නිළියන්

'ජනප්‍රිය ටෙලි නාට්‍ය නිළියක් ගණිකා මඩමකදී පොලීසියට හසුවෙයි'

මෙවැනි ආරංචි මෑතකාලයේ අසීමිතව අසන්නට ලැබුනි. ජනප්‍රිය හෝ ප්‍රවීන යන විශේෂණ නාමය නිසා මෙවැනි ආරංචි වඩා විමසිලිමත් වන අය, විවිධ ශිල්පීන් සඳහා විවිධ වූ නිර්නායක ලබා දේ.

මෙවැනි සිද්ධීන් තුළ සිටින්නේ සැබෑවටම ජනප්‍රිය හා ප්‍රවීන ශිල්පීන්ද?

ටෙලිනාට්‍යයක, සිනමාපටයක,වෙළඳ දැන්වීමක පෙනී සිටි පමණින් කිසිවෙක් ජනප්‍රියත්වයට පත් නොවේ. තම ප්‍රවෘත්තියට වටිනාකමක් දෙන්නට බොහෝ මාධ්‍ය විශේෂණ නාම යොදමින් විවිධ උපක්‍රම යොදවයි. රඟපෑමේ ආසාව මුදුන්පත් කරගැනීමට ඕනෑම පරිත්‍යාගයක් කරන්නට සැදීපැහැදී සිටින්නවුන් බොහෝය. යම් නිර්මාණයකට පෙනී සිටින්නට වරම් ලැබූ පසු ඒ වරම ආයුධයක් බවට පත් කරගෙන තම පෞද්ගලික ජීවිතයේ ඕනෑ එපාකම් ඉටු කර ගැනීමට බොහෝ දෙනා පෙළඹෙයි.

එමෙන්ම ජනප්‍රිය ශිල්පිනියන්ද රහසේ තම පෞද්ගලික ජීවිතය සුපිරි ලෙස ගත කිරීමට විවිධ ක්‍රමෝපායන් කිරීම ලොවට නම් රහසක් නොවේ. සුපිරි නිවාස, යාන වාහන ඇතුළු සුපිරි ජීවිතය ලාංකේය නිළි වෘත්තියෙන් ඉටුකර ගැනීමට නොහැකි වග දන්නා ඔවුහු තම 'නිළි' නාමය අනිසි ලෙෂ විකුණන්නට දෙවරක් නොව එක් වරක් නොසිතා පෙළඹේ.

එහෙත් ඇතැමුන් කලාවට එන්නේම ගණිකා වෘත්තියේ යෙදෙන්නටය. එසේ පැමිණෙන ශිල්පිනියන් මාධ්‍යවලට තමන්ගේ සහභාගිත්වය දුන් නිර්මාණ නාමාවලි සඳහන් කළද ප්‍රේක්ෂකයා ඔවුන් නොහඳුනයි.

මෙතැන වරද කරන්නේ අදාල ශිල්පිනියන්ද, ඔවුන් ගැන පවසන මාධ්‍යයද ජනප්‍රිය ශිල්පිනියන් යැයි පිළිගන්නා අයද යන්න ගැන විමසිලිමත් විය යුතුය.

මේ සියලු දේ තුළින් හෑල්ලුවට ලක්වන්නේ සමස්ථ නිළි පරපුරටම වීම ඛේදවාචකයකි.

'කටකතාවලට මම බය නැහැ, කටකතාවලින් මාව වට්ටන්න බැහැ' යැයි කියමින් ඇතැම් නිළියන කරන්නේම අනිසි දේය. දේවත්වයෙන් පිදිය යුතු කලා වෘත්තිය අපුල තැනක් බවට ඔවුන් විසින්ම පත් කරගෙන සිටියි. ඇතැම් ජනප්‍රිය නිළියන්, ගායිකාවන්, නිරූපිකාවන්, රූ රැජිනියන් ප්‍රසිද්ධියේ තලු මරනා පවුල් ජීවිතයේ සාර්ථකත්වය ඔවුන් අහලකවත් නොවේ. ඇතැමුන්ට තමන් මව්වරුන් බවද අමතකය. මේ සියලු කරුණු කාරණා මැද ඔවුන් විකිණෙන්නේ 'නිළි' නාමය ඉදිරියට දමමිනි. ඇතැමුන් තම ගත පැය ගණනට ලංසු කරන්නේ දහස් ගණනින් මෙන්ම ලක්ෂ ගණනිනි.

නිළියක යනු විකිණිය යුතු තැනැත්තියක්ද?

ඔව්, නමුත් එසේ විකිණිය යුත්තේ තම කලා හැකියාව මිස වෙනත් දේ නම් නොවේ. කලා හැකියාව ඉදිරියට දමමින් මෙසේ විකිණෙන්නේ, අන් අය පරයමින් සුපිරි ජීවිත ගෙවන්නට කැමැත්තෙන් සිටින අයයි. තම ආත්ම ගෞරවය මුදලට යටපත් නොකරන ශිල්පිනියන්ට 'ගණිකා නිළියන් ' නිසා සිදුවන්නේ අසාධාරණයකි. ඒ කෙතරම් යහපත්ව උන්නද ඔවුන්ද අනිසි නම් ගොන්නට තල්ලු වී යන බැවිනි. එහෙත් එවැනි වැරදි වැටහි කාලයක් සමඟ වියැකී යන්නේ සත්‍ය කිසි දවසක සැඟවිය නොහැකි නිසාවෙනි.

මතක සටහන - ආනන්ද පද්මසිරි ලියයි

හමුවීම් - වෙන්වීම් ගැන ගැයූ ජෝති

1952 දී වසන්තා සන්දනායක සමග 'මහවැලි මාදියේ 'ගීතයේ යුග ගායනයට හවුල් වෙමින් ගී ලොවට පිවිසි එච්.ආර් ජෝතිපාලයන්ගේ මුල්ම තනි ගීතය වූයේ 1954 දී පමණ ස්ටැන්ලි ඔමාර් හදා දුන් 'මගේ රන් රාජිනී' ගීතයයි. 1956 දී 'සුරතලී ' චිත්‍රපටයට 'සිරියමෙසාරා' ගීය ගයමින් සිනමාවට එක් වූ ඔහු එක් රැයකින් රසික හදවත් තුළ ස්ථාවර විය. 1987 ජූලි මස 7 වෙනිදා මිය යන තුරුම ඒ ස්ථාවරත්වය එලෙසම පැවතුණි.

එම මුල් යුගයේ සිටම කාන්තා ආකර්ෂණය ඉහළින්ම දිනා ගත් ගායකයා වූයේ ජෝතිය. ඔහුගේ ළයාන්විත හඬින් ගැයුණු ආදර හා විරහ ගීත වලට රසිකාවියෝ වශී වූහ. ඇතැම් ප්‍රසංග භූමිවලදී රසිකාවියන්ගේ ඉල්ලීම පරිදි ඔවුන්ගේ අත්වල පමණක් නොව ළමැදේ පවා අත්සන් තබන්නට ජෝතිට සිදුවිය. ඇතැම් කාන්තාවන් ඔහුට කොතෙක් ප්‍රිය කළාද කියතොත් තම නිවෙස් වලට 'ජෝති විලා, ජෝති මහල්, ජෝතිපාය' ආදී වශයෙන් නම් තබාගෙනද තිබේ.

ජෝතිගේ ජීවිතයට සමීප වූ කාන්තා පාර්ශවයට ඔහු ඇමතුවේ 'මැණිකේ 'යන ආදර නාමයෙනි, ජෝති 'මැණිකේ ' යන ඇමතුමට ඉතා ප්‍රිය කළේය. එවැනි එක් 'මැණිකේ ' කෙනෙකු පිළිබඳ පෞද්ගලික අත්දැකීමක් හිතවත් ගීත නිබන්ධක ධර්මසිරි ගමගේට කියා ගීත දෙකක් ලියවාගෙන අතීතයේ ගැයුවේය.

'අඩන්නෙ ඇයි සුදු මැණිකේ - කියන්න පණ මාගේ . . .'
'එපා එන්න කියලා - මොකෝ මැණිකේ කිව්වේ . . . '

මේ ගීත දෙකම ජෝතිගේ ගීතාවලියේ අති ජනප්‍රිය ගීත දෙකක් බවට පත් විය.

කළක් ගුවන් සේවිකාවක් ජෝතිට දැඩිව ආදරය කළාය. ජෝතිත් ඇයට ආදරය කළත් වෙනත් බාධක නිසා 'එක්වීමක් ' ගැන සිතන්නට නොහැකි විය, ඔහු අවසානයේ ඇයට දුන් විසඳුම වූයේ තමා වැනිම කෙනෙකු සොයාගෙන විවාහ වී හොඳින් ජීවත්වන ලෙසයි. ඒ අනුව ඇය විවාහ වූයේද රුවින් ඔහුට බෙහෙවින් සමාන සිනමාකරුවෙකු සමගය. ඔහු ජෝතිගේ ඉතා සමීප මිතුරෙකු වූ අතර පවුලේ හිතවතෙකු ලෙස ජෝතිගේ මරණය දක්වාම ඔවුහු ළඟින් ඔහුව ඇසුරු කළහ. ඇයගේ නමේ කොටසක් වන 'රංගනී ' යන කොටස යොදාගෙන ගීත රචනා කරවාගත් ජෝති ඔවුන්ගේ ආදර සබැඳියාව පැවැති යුගයේ එම ගීත ගායනා කළේය.

'සමන් මල් පියල්ලේ
සඳේ රැස් කැරැල්ලේ
ප්‍රීතී වලාවන් එක්වී
සංගීත රාවෙන් මත් වී
මගේ රංගනීයේ. . . . '
(ගී පද - බණ්ඩාර කේ. විජේතුංග)

'ලස්සනයි බලන්න
ඔයාගේ මල් සිනා
පුන්සඳක් නැගෙන්න
එපා කැලුම් පෙරා
හෝ රංගනී - මා නිසාද ඔය නටන්නේ '
(ගී පද - සිරිල් ඒ. සීලවිමන)

'රංගනියේ නුඹ නින්දා
මා නොවිඳන දුක් වින්දා. . . .'
('මා බැන්ද ගෙයක් තිබුනා' ගීතය)

මේ ගීත තුනද රසික ජනතාව අතර ඉමහත් සේ ජනප්‍රිය විය. ජෝති මිය ගියාවත් පසුකාලයක මේ 'රංගනී 'ගේ දෙවන දියනිය කලා ක්ෂේත්‍රයට පැමිණ ජනප්‍රියත්වයට පත් වූවාය, 'සත්සර' හා 'සරසි' පුවත්පත්වල මා සේවය කරද්දී එක්තරා විශේෂාංගයක් සඳහා ඇය කැමති ගීත හතක් නම් කරන්නයැයි මම ඇයට කීවෙමි. ගත් කටටම අංක එක ලෙස ඇය නම් කළේ 'සමන්මල් පියල්ලේ 'ගීතයයි. එය ජෝති අන්කල් විසින් ගයා ඇත්තේ තම මෑණියන්ට ඔහු පෙම් කළ අතීතයේ බව ඒ වන විට ඇය දැන සිටියාය.

ඇයට සිහිනි වියේ සිටම නිවසේදී නිතර ජෝතිගේ ගීත අසන්නට ලැබුනේ මව ඒවා අසන බැවිනි. ඒ අතරිනුත් 'සමන්මල් පියල්ලේ 'ගීය වැඩිපුර ඇසුන නිසාදෝ එම ගීතය විශේෂ ලෙස ඇයගේ මතකයේ රැඳී තිබුනේය.

'මගෙ ජීවිතයේ සතු වී
තිබූ දෙයක්
මා ඇසුරෙන් වෙන් කෙරුවා '
(ගී පද - ඇලොයි ගුණවර්ධන)

කලක් ගම්පහ ප්‍රදේශයේ තරුණියකට ජෝති ආදරය කළේය. ඇය ගම්පහ මාර්කැට්ටුවේ ව්‍යාපාරිකයෙකුගේ නැගණියක වූවාය. ඇය හමුවන්නට ඇති අවශ්‍යතාවය නිසාම ජෝති ගම්පහින් කාමරයක් කුලියට ගෙන එහි නැවතී සිටියේය. ඒත් මේ ඇසුරට තරුණියගේ අයියා කැමති වූයේ නැත, ඔහු දිනක් මැරවරයන් යොදා ජෝතිට දරුණු ලෙස පහර දුන්නේය. මහා මාර්ගයේ මේ සිදු වූ දරුණු ප්‍රහාරය මැඩ පැවැත්වූයේ ඒ මොහොතේ එතැනට ආ රෙජී රණතුංග (අමාත්‍ය අර්ජුන රණතුංගගේ පියා) විසිනි. ඔහුද එවකට ගම්පහ ප්‍රබල ව්‍යාපාරිකයෙකුව සිටියේය. රෙජී එම සතුරන්ව පළවා හැර ඇත්තේ අහසට වෙඩි තැබීමෙනි,

ඉන් පසුව පෙම්වතියට හා ගම්පහට ආයුබෝවන් කියන්නට ජෝතිට සිදු විය. ඒ බව ඇලොයිට කියා 'මගේ ජීවිතයේ ' ගීතය ලියවාගෙන ඔහු ගායනා කළේය. 'රන් මැණිකා සීදේවි' යනුවෙන් එහි ලියවී ඇත්තේ ජෝති වැඩි ආදරයට ඇයට රන් මැණිකා ලෙස අමතා ඇති බැවිනි. මේ ගීතයද ජෝතිගේ ගීතාවලියේ අමරණීය ගීතයකි. වේදනාත්මක ස්වරයෙන් ඔහු ගැයූ මේ ගීතය 1987 ජූලි 8 වනදා රාත්‍රියේ මාලිගාවත්තේ 'ප්‍රදීපා' ශාලාවේ ඔහුගේ දේහය අසල වාදනය වෙද්දී 'මගෙ ජීවිතයේ සතු වී තිබූ දෙයක් මා ඇසුරෙන් වෙන් කෙරුවා' යන පදපෙලෙහි අරුත මරුවා විසින් ජෝති අප ඇසුරෙන් වෙන් කර ගැනීමටද සමාන යැයි මට සිතුණි.